# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2115/8 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012(III)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 6, 7, 8, 9 සහ 10 වන වගන්ති සමග කියවිය යුතු එහි 61 වන වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පී. හැරිසන්,<br>
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු,<br>
පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග<br>
සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2019 මාර්තු මස 14 වන දින,<br>
කොළඹ දී ය.

නියෝග

1996 නොවැම්බර් මස 07 වන දින අංක 948/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම නියෝගයේ 2 වන නියෝගයට පෙරාතුවම පහත සඳහන් වචන හා ඉලක්කම් ඇතුළත් කිරීමෙන් :-

'' **I** වන කොටස''

(2) එම නියෝගයේ 8 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝග ඇතුළත් කිරීමෙන් :-

''9. මේ නියෝග යටතේ ධීවර මෙහෙයුම් සඳහා ප්‍රදානය කරන ලද යම් බලපත්‍රයක් දරන්නකු විසින් -

(1) ධීවර බෝට්ටුවේ නියමුවා හෝ ප්‍රධානියා විසින් බෝට්ටුවේ ලියාපදිංචි සහතිකය හෝ එහි සහතික කළ පිටපතක් සමග ශ්‍රී ලංකා ජල තීරය තුළ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා වන බලපත්‍රය සියලු අවස්ථාවන්හි දී බෝට්ටුව තුළ තබාගත යුතු බවට සහ යම් බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී එම බලපත්‍රය සහ බෝට්ටුවේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරනු ලබන බවට ;

(2) මෙම නියෝග යටතේ නිකුත් කළ යම් බලපත්‍රයක අධිකාරිය යටතේ හැර ශ්‍රී ලංකා ජල තීරයේ කිසිදු කොටසක ධීවර කටයුතු සිදු නොකරන බවට ;

(3) පහත සඳහන් වර්ගවලට අයත් ධීවර බෝට්ටුවල විදුලි ජනක යන්ත්‍ර රැගෙන නොයන බවට :-

(අ) යන්ත්‍රික නොවන පාරම්පරික බෝට්ටු (NTRB)
(ආ) යාන්ත්‍රික පාරම්පරික බෝට්ටු (MTRB)
(ඇ) මාදැල් බෝට්ටු (යාන්ත්‍රික නොවන) (NBSB)
(ඈ) පිටත සවි කරන ලද එන්ජින් සහිත ෆයිබර් බෝට්ටු (OFRP)
(ඉ) ඇතුළත එන්ජින් සවිකළ එක් දින බෝට්ටු (IDAY) ;

(4) ධීවර බෝට්ටුවේ නියමුවා හෝ ප්‍රධානියා විසින් පිටත එන්ජින් සවි කරන ලද ධීවර බෝට්ටු සඳහා භාවිතා කරනු ලබන පහන් ආලෝකමත් කිරීම පිණිස විදුලිය ජනනය කිරීම සඳහා වෝල්ට් 12 ට නොවැඩි වෝල්ටීයතාවයක් සහිත බැටරියක් භාවිත කරන බවට ;

(5) යම් ධීවර යාත්‍රාවක ආලෝකය ලබා ගැනීමේ කාර්යය සඳහා කෘත්‍රිම පහන් භාවිත කරනු ලබන යම් තැනැත්තකු විසින් පහත සඳහන් උපරිම වෝලටීයතාවන් නොඉක්මවනු ලබන කෘත්‍රිම පහන් භාවිත කරනු ලබන බවට :-

| *කෘත්‍රිම පහන් වර්ගය* | *බල්බ සංඛ්‍යාව* | *උපරිම වොට් ගණන* |
|---|---|---|
| 1. සූත්‍රිකා බල්බ | 2 | 60w |
| 2. ෆ්ලොරසන්ට බල්බ | 2 | 60w |
| 3. LED බල්බ | 2 | 10w |
| 4. CFL බල්බ | 2 | 12w |

(6) කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරය තුළ මසුන් ආකර්ෂණය කිරීම සඳහා කෘත්‍රිම පහන් ආලෝකය භාවිත කරනු නොලබන බවට :

එසේ වුවද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ජලජ සම්පත්, පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනය විමසා, බිලී බෑම, අතංගුව, අත්යොත් පන්නය සහ මත්ස්‍ය උගුල් වැනි සුළු පන්න ධීවර කටයුතුවල නිරත වන තැනැත්තන් සඳහා කෘත්‍රිම පහන් ආලෝකය භාවිත කිරීමට විශේෂිත අවසරයක් ලබාදිය හැකි ය.

(7) කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරය තුළ මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සඳහා වට කරන දැල් භාවිත කිරීමේ දී වෙරළ සීමාවේ සිට සැතපුම් හතක් (07) හෝ නාවුක සැතපුම් හයයි දශම බින්දුවයි අටක් (6.08) එනම් කිලෝ මීටර් එකොළහයි දශම දෙකයි හයක් (11.26) ඇතුළත මුහුදු සීමාවේ වට කරන දැල් භාවිත කරනු නොලබන බවට,

සහතික කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

10. GPS උපාංග සහ ගැඹුරු මාපකය වැනි උපකරණ යම් බෝට්ටුවක් තුළ ගෙනයනු ලබන්නේ නම් අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් ඒ පිළිබඳව බලපත්‍රයේ සඳහන් කළ යුතු ය.

## II වන කොටස

11. ශ්‍රී ලංකා ජල තීරය ඇතුළත කිමිදුම් ධීවර මෙහෙයුම් වල නිරත යම් තැනැත්තකු විසින් එකී ධීවර මෙහෙයුම් පෙ.ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා දිවා කාලය තුළ දී සිදු කරනු ලැබිය යුතු ය.

12. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කිමිදුම් ධීවර මෙහෙයුම් සිදු කරනු ලබන එක් එක් මත්ස්‍ය වර්ගය සම්බන්ධයෙන් වෙනම බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

13. මේ නියෝග යටතේ ප්‍රදානය කරනු ලබන එවැනි යම් බලපත්‍රයක් අවසරලත් මත්ස්‍ය වර්ගය ඇල්ලීම සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.

14. ස්කුබා කිමිදුම් ධීවර මෙහෙයුම් මගින් හක් බෙල්ලන් සහ මුහුදු කුඩැල්ලන් ඇල්ලීම කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, සම්බන්තොට, අම්පාර, මඩකලපුව, පුත්තලම, මන්නාරම, යාපනය, මුලතිව් සහ කිලිනොච්චි යන පරිපාලන දිස්ත්‍රික්කවල සිදු කරනු ලබන යම් තැනැත්තකු විසින් එම ධීවර මෙහෙයුම් වෙරළේ සිට නාවික සැතපුම් හතරක් (4) (කි.මී. 7.4ක්) එපිට මුහුදු සීමාව තුළ සිදු කළ යුතු ය ඃ

එසේ වුව ද, එම ධීවර මෙහෙයුම් ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ සිදු කරනු ලබන්නේ නම් වෙරළේ සිට නාවුක සැතපුම් දෙකක් (2) (කිලෝ මීටර 3.7) එපිට මුහුදු සීමාව තුළ සිදු කළ යුතු ය.

15. ශ්‍රී ලංකා ජල තීරය ඇතුළත ස්කුබා කිමිදුම් ධීවර මෙහෙයුම්වල නිරත වන යම් ධීවර බෝට්ටුවක නියමුවකු හෝ ප්‍රධානියකු විසින් ස්කුබා මෙහෙයුම් බලපත්‍රලාභියකු නොවන නියමුවා සමග කිමිදුම්කරුවන් දෙදෙනකු පමණක් එකී බෝට්ටුවෙහි රැගෙන යා යුතු ය.

16. ශ්‍රී ලංකා ජල තීරය ඇතුළත් ස්කුබා කිමිදුම් ධීවර මෙහෙයුම්වල නිරත වන යම් ධීවර බෝට්ටුවක නියමුවකු හෝ ප්‍රධානියකු විසින් එකී බෝට්ටුවේ සිලින්ඩර අටක් නොඉක්මවනු ලබන සිලින්ඩර සංඛ්‍යාවක් රැගෙන යා යුතු ය.

17. කිසිදු ස්කුබා කිමිදුම් ධීවර මෙහෙයුම් බලපත්‍රලාභියකු විසින් හැඹිලි (පර්සින්) දැලකින් මාළු ඇල්ලීමේ කාර්යයෙහි නිරත වීම සඳහා එම බලපත්‍රය භාවිත නොකළ යුතු ය.

18. හක් බෙල්ලන්, මුහුදු කුඩැල්ලන්, පොකිරිස්සන් සහ විසිතුරු මසුන් ඇල්ලීම සඳහා නිකුත් කළ බලපත්‍රයක් ඇති කිසිදු ස්කුබා කිමිදුම් ධීවර මෙහෙයුම් බලපත්‍රලාභියකු විසින් එකී බෝට්ටුව තුළ යම් ඇවිලුම් බිලි, උල් ආයුධ හෝ දියයට මසුන් ඇල්ලීමට විදින තුවක්කු (Spear gun) රැගෙන නොයා යුතු ය.

19. ඉහත කොන්දේසි උල්ලංඝනය කරනු ලබන යම් කිමිදුම් ධීවර මෙහෙයුම් බලපත්‍රලාභියකුගේ බලපත්‍රය එකී උල්ලංඝනය කිරීම ඔප්පු වූ වහාම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

## **III** වන කොටස

20. ජා කොටු තැනීම සඳහා භාවිත කරනු ලබන ද්‍රව්‍ය සහ එකී ජා කොටු ශ්‍රී ලංකා ජල තීරය තුළ ඉදි කරනු ලැබිය යුතු ස්ථානය පිළිබඳව GPS මිනුම් අනුව, ජාතික ජලජ සම්පත්, පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන වෙනත් යම් පර්යේෂණ ආයතනයක නිර්දේශය මත, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

21. සෑම ජා කොටු බලපත්‍රලාභියකු විසින් ම රාත්‍රී කාලයේ දී ජා කොටුවල පිහිටීම හඳුනා ගැනීම සඳහා නියමු දැල සම්බන්ධයෙන් සංඥා ආලෝක පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

22. කිසිදු ජා කොටු බලපත්‍රලාභියකු විසින් කොරල්පර ආසන්නයේ, මුහුදු පැළෑටි හෝ මුහුදු තණ ප්‍රදේශ තුළ, වෙනත් මුහුදු ක්ෂිරපායින්ගේ වාසස්ථාන හෝ මාදැල් මෙහෙයුම් ප්‍රදේශ හෝ මාදැල් වරාය තුළ ජා කොටුවක් ඉදි කිරීම සිදු නොකළ යුතු ය.

23. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ජාතික ජලජ සම්පත්, පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන වෙනත් යම් පර්යේෂණ ආයතනයක නිර්දේශය මත යම් පරිපාලන දිස්ත්‍රික්කයක ඉදි කළ යුතු ජා කොටු සංඛ්‍යාව නිශ්චය කරනු ලැබිය යුතු ය.

24. ජා කොටුව තුළට මසුන් රැස් කිරීම සඳහා වන නියමු දැල් වැටෙහි උපරිම දිග සහ දැලෙහි ඇස් විශාලත්වය පිළිවෙලින් මීටර් 75 ක් නොඉක්මවිය යුතු සහ අඟල් 1 1/4 ට වඩා අඩු නොවිය යුතු වන්නේ ය.

25. ජා කොටු දෙකක් අතර දුර මීටර් 300 ට වඩා අඩු නොවිය යුතු ය.

26. යම් ජා කොටු බලපත්‍රලාභියකු විසින් ඉහත නියෝග උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියා කරනු ලබන්නේ නම් එම් ජා කොටු බලපත්‍රලාභියාගේ බලපත්‍රය එකී උල්ලංඝනය කිරීම ඔප්පු වීමෙන් අනතුරුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුත ය.''

04 - 29

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.